# ශ්‍රී ලංකාවේ වත්මන් කෞතුකාගාර පද්ධතිය තුළ ගොඩනැංවිය යුතු නවාංගයන් පිළිබඳ විමර්ශනයක්

**ලත්හාරි යූ.සී.**[1]

පුරාවස්තු රැසකින් සමන්විත කෞතුකාගාර පද්ධතියේ අංශ ගණනාවක් යටතේ නිදර්ශන රැසක් වේ. මෙකී පුරාවස්තූන් නැරඹීමට දේශීයවූත් විදේශීයවූත් විවිධ වයස් පරතරයන්ගෙන් යුත් ජන පිරිස් පැමිණේ. විවිධ අංශයන් යටතේ පවත්නා වූ උරුම නිදර්ශනයන්හි මහජන දර්ශනයේ ඵලදායීතාවය ඉහළ නංවනු වස් උපයෝගී කරගන්නා නව මූලධර්ම රැසක් පවතී. ලාංකීය කෞතුකාගාර පද්ධතිය තුළ උරුම නිදර්ශනයන්හි මතු උන්නතිය උදෙසා ගොඩනැංවිය යුතු නවාංගයන් මොනවා ද? යන පර්යේෂණ ගැටලුවත් අරමුණ වශයෙන් ශ්‍රී ලංකාවේ වත්මන් කෞතුකාගාර පද්ධතිය තුළ ගොඩනැංවිය යුතු නවාංගයන් සංචාරක ප්‍රවර්ධනය, අධ්‍යාපනික ප්‍රවර්ධනය, සෞන්දර්යාත්මක ප්‍රවර්ධනය සහ පර්යේෂණ ක්‍රම ප්‍රවර්ධනය යන ප්‍රභේදයන් යටතේ හඳුනාගැනීමත් පෙන්වා දිය හැක. දත්ත එක්රැස් කරගැනීමට ප්‍රාථමික මූලාශ්‍ර වශයෙන් සම්මුඛ සාකච්ඡා ද ද්විතීයික මූලාශ්‍රය වශයෙන් සාහිත්‍යමය හා අන්තර්ජාල මූලාශ්‍රයන් ද යොදා ගැනිණි. ලොව බොහෝමයක් කෞතුකාගාර ආශ්‍රිතව තිරසාර උරුම සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය සහ සමාජ වෙනස්කම් ගෙන ඒමටත් කෞතුකාගාර නරඹන්නන් දිරිමත් කිරීමටත් විවිධ සේවා සැපයේ. ඒ අතරින් තවමත් ලාංකීය කෞතුකාගාර ආශ්‍රිතව ගොඩනැංවී නැති නවාංගයන් රැසකි. මෙහිදී සංචාරක ප්‍රවර්ධනය සඳහා කෞතුකාගාර ආශ්‍රිතව සිදු කරන්නාවූ මඟ පෙන්වන චාරිකාවන් සහ අමුත්තන් සඳහා කෞතුකාගාර සමාජත් කෞතුකාගාර සඳහා සංචාරක ප්‍රදර්ශනත් විවිධ අබාධ සහිත අමුත්තන් සඳහා විශේෂ දේශනත් සාමාන්‍ය අමුත්තන් සඳහා කාසි, කෞතුක වස්තු, පොත් සහ සිතුවම් නිවාරණ සංරක්ෂණ වැඩමුළුත් සිදු කළ හැක. අධ්‍යාපනික ප්‍රවර්ධනයට දරුවන් සඳහා අධ්‍යාපන වැඩමුළුත් විශේෂ අවශ්‍යතාවන් සහිත දරුවන් සඳහා විශේෂ වැඩමුළුත් ඊට ළමා ක්‍රියාකාරකම් සහ වැඩසටහන් කෞතුකාගාරය තුළම ක්‍රියාවට නැංවීමටත් ප්‍රයෝගික දැනුම, උරුම හැඳිනීම, පුරාණ තාක්ෂණයේ නව භාවිතාවන් හැඳිනීමටත් හැකි වේ. සෞන්දර්යාත්මක ප්‍රවර්ධනයේදී පවුලක් වශයෙන් පැමිණෙන්නන්ට කලාව හෝ විද්‍යාව සම්බන්ධයෙන් පවුලේ වැඩමුළුත් වාචික ඉතිහාසය වාර්තාගතකරණය, කලා උත්සව විශේෂාංගයන් සහ විනෝදාංශ කඳවුරු යනාදීන් මඟින් ඒකාකාරිත්වයෙන් තොරව දැනුම ගවේෂණයට ඉඩ සැළසේ. ලන්ඩනයේ බ්‍රිතාන්‍ය කෞතුකාගාරය සහ නිව්යෝක්හි මෙට්‍රොපොලිටන් කෞතුකාගාරය මීට නිදසුන් වේ. පර්යේෂණ ක්‍රම ප්‍රවර්ධනයේදී ස්වේච්ඡා සේවකයන් සමග ක්ෂේත්‍ර වැඩ කටයුතු කිරීමත් උරුමය සඳහා දේශන- තාවකාලික ප්‍රදර්ශනත් අස්පෘශ්‍ය සංස්කෘතික උරුමයේ සංරක්ෂණය පිළිබඳ ප්‍රදර්ශන යනාදී විශේෂාංගයන් හරහා අමුත්තන් කෙරෙහි රුචිකත්වයක් ඇති කළ හැක. ලාංකීය කෞතුකාගාර පද්ධතියේ මෙකී නවාංගයන් දියුණු කිරීමෙන් ලක් උරුමය ජාත්‍යන්තරයට ගෙන යාමටත් අනාගත සංචාරක ආකර්ෂණය වැඩි දියුණු කර ගැනීමටත් හැකියාව ලැබේ.

**මුඛ්‍ය පද** : ලාංකීය, කෞතුකාගාර, පද්ධතිය, සංචාරක, ප්‍රදර්ශන

[1]ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, lathharic@gmail.com